**……………………………………………….. අමාත්‍යාංශය**

**කැමරා ශිල්පී තනතුර සඳහා සහ වීඩියෝ කැමරා ශිල්පී තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීම සඳහා අදාල පරිපාටිය**

**01.** **සම්බන්ධ වන ආයතන**

| | | | | |
|---|---|---|---|---|
| **1.1** | **අමාත්‍යාංශය** | **:** | **යොමු අංකය :** | **දිනය :** |
| **1.2** | **කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම** | **:** | යොමු අංකය : | දිනය : |
| **1.3** | **ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය** | **:** | යොමු අංකය : | දිනය : |
| **1.4** | **වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය** | **:** | යොමු අංකය : | දිනය: |
| **1.5** | **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය** | **:** | යොමු අංකය : | දිනය : |

**02.** **පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර**

**2.1** තාවකාලික පදනම මත පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද …………………………………………….අමාත්‍යාංශයේ ලේකම්

**03.** **පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :**

ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුණතාවයන්, එනම් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) මට්ටම පහ (5) යටතට ගැනෙන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමිකර ගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

**04.** **තනතුරේ ස්වභාවය :-** මෙම තනතුර තාවකාලික තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

**05.** **මාසික දීමනාව :-**

5.1 කැමරා ශිල්පී තනතුරේ ( තාවකාලික) මාසික දීමනාව : රු. 14,425.00

5.2 වීඩියෝ කැමරා ශිල්පී තනතුරේ ( තාවකාලික ) මාසික දීමනාව : රු. 14,425.00

**06.** තාවකාලික පදනම යටතේ බඳවා ගැනීමට අනුමත තනතුර / තනතුරු

**6.1** අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| කැමරා ශිල්පී තනතුර | 01 | 1.නිශ්චල ඡායාරූප ගැනීම හා මුද්‍රණය.<br>2.මුද්‍රණ හා ඡායාරූප රසායනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු.<br>3. ඡායාරූප ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු.<br>4. ඡායාරූප ලේඛන පවත්වා ගෙන යාම සහ සුචිගත කිරීම.<br>5. ඡායාරූප අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩාව භාරව කටයුතු කිරීම.<br>6. වීඩියෝ ඡායාරූපකරණය.<br>7.ෆොටෝ ගෙම්ට් ක්‍රමයට ඡායාරූප ගැනීම හා ඩිජිටල් ක්‍රමය අනුව ඡායාරූප සකස් කිරීම.<br>8.පරිගණක ආශ්‍රිත මුද්‍රණය.<br>9. ආයතනික ප්‍රධානියා / අංශ ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනිකුත් කාර්යයන් |
| වීඩියෝ කැමරා ශිල්පී | 01 | 1.වීඩියෝ කිරීම ,විශේෂ වැදගත්කමකින් යුත් අවස්ථා ඡායාරූප ගත කිරීම හා සංස්කරණය.<br>2. සංස්කරණ උපකරණ හා සංස්කරණ මැදිරිය භාරව කටයුතු කිරීම හා එහි නඩත්තු කටයුතු.<br>3. වීඩියෝපට ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු.<br>4.වීඩියෝ පට ලේඛනයක් පවත්වා ගෙන යාම හා සුචිගත කිරීම.<br>5.වීඩියෝ කැමරා අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩාව භාරව කටයුතු කිරීම.<br>6. ඇස්තමේන්තු සකස් කිරීම.<br>7.ඕනෑම වර්ගයකට අයත් කැමරාවක් පරිහරණය කිරීම, ගෙම්ට් ඡායාරූප ගැනීම, ඩිජිටල් ක්‍රමය අනුව රූපරාමු ලබාගැනීම හා සකස් කිරීම.<br>8. පරිගණක ආශ්‍රිත සංස්කරණය<br>9. ආයතන ප්‍රධානියා/අංශ ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනිකුත් කාර්යයන් |

6.2 **ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :**

6.2.1 කැමරා ශිල්පී : 01 ( * )

6.2.2 වීඩියෝ කැමරා ශිල්පී : 01 ( * )

( * කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කර ඇති ආකාරයට තනතුරු සංඛ්‍යාව සඳහන් කළ යුතුය. )

**07.** **තාවකාලික පදනම මත බඳවා ගැනීම**

7.1 කැමරා ශිල්පී හා වීඩියෝ කැමරා ශිල්පී තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :

7.1.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස ( සා.පෙළ ) විභාගයේදී ගණිතය සහ සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව ඇතුළුව අවම වශයෙන් විෂයයන් 04කට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06කින් සමත්ව තිබීම.

7.1.2 වෘත්තීය සුදුසුකම් : ඡායාරූපකරණය පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් ( NVQ ) මට්ටම 5ට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

7.1.3 පළපුරුද්ද ( * ) : තනතුරට අදාල රාජකාරී සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

7.1.4 කායික සුදුසුකම් : සැම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.1.5 වෙනත් සුදුසුකම් :
1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට, එම සුදුසුකම් සැම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

( * ආයතනයේ අවශ්‍යතාවය අනුව ඇතුළත් කළ යුතුය.)

**7.2** **වයස** **:**

අවම සීමාව : අවුරුදු 18

උපරිම සීමාව : අවුරුදු 45

**7.3.1** **බඳවා ගැනීමේ ක්‍රමය** : ප්‍රායෝගික පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් . අයදුම්කරු බඳවා ගනු ලැබේ

ප්‍රායෝගික පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| (අ) කැමරා ශිල්පී තනතුර | | |
| • කැමරාවක් ක්‍රියාකරවීම හා රූපගත කිරීම | 60 | 40% |
| • ආලෝකය සැපයීම හා නවීන තාක්ෂණික ක්‍රම භාවිතය | 20 | |
| • පැහැදිලි ඡායාරූප ගැනීම | 20 | |
| එකතුව | 100 | |

| | | |
|---|---|---|
| (ආ) වීඩියෝ කැමරා ශිල්පී තනතුර<br>1. වීඩියෝ කැමරා සහ ඊට අදාළ උපකරණ ක්‍රියාකරවීම.<br>2. වෘත්තීය ආවරණයට සුදුසු පරිදි දර්ශන තෝරා ගැනීම හා දත්ත එක්රැස් කිරීම.<br>3.රූපවාහිනි දර්ශන වලට අදාළව ස්වාභාවික ආලෝකය උපයෝගි කරගැනීම හා රූපගත කිරීම සඳහා විදලි ආලෝකය යෙදීම.<br>4. පරිගණක තාක්ෂණය භාවිතයෙන් ප්‍රවෘත්ති සංස්කණය පිළිබඳ හැකියාව.<br>5. කැසට් පට පටිගත කිරීමේ තාක්ෂණය හා ඊට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම.<br>6. රූපවාහිනි මැදිරි තුළ රූගත කිරීම පිළිබඳ සාමාන්‍ය දැනුම. | 30<br>20<br>20<br>10<br>10<br>10 | 40% |
| එකතුව | 100 | |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය 100 % | තෝරා ගැනීමට සළකා ලබන අවම ලකුණු ප්‍රමාණය. |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ. |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 | |
| වෘත්තීය පළපුරුද්ද | 30 | |
| තොරතුරු තාක්ෂණය/ පරිඝණක හැකියාව පිළිබඳ සුදුසුකම් | 10 | |
| භාෂා ප්‍රවීණතාවය | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසළතාවය | 05 | |

සටහන - ප්‍රායෝගික පරීක්ෂනය සමත් අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය යන දෙකෙන්ම ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**7.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** : ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සකස් කලේ : අත්සන ............................
**( විෂය භාර කණිෂ්ය මාණ්ඩලික නිලධරයා )**
නම :
තනතුර :
දිනය :

පරීක්ෂා කලේ : අත්සන ............................
**( විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා )**
නම :
තනතුර :
දිනය :

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................................................

**( දෙපාර්තමේන්තු ප්‍රධානියා )**

නම : ........................................
තනතුර : ........................................
නිල මුද්‍රාව : ........................................

දිනය :

---

යොමු අංකය : ..........................................

............................................................... හි ......................................................................... තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ........................................
නම : ........................................

**( ලේකම් )**

............................................
........................ අමාත්‍යාංශය

නිල මුද්‍රාව : ........................................

දිනය :

---

යොමු අංකය : ..........................................

............................................................... හි ......................................................................... තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ........................................
නම : ........................................

**ලේකම්**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව.**

නිල මුද්‍රාව : ........................................

දිනය :